**ශීර්ෂය 04 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු ආයතනය ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** ආයතනය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වෙනත් මූලාශ්‍ර ලැබීම් රු.4,977,069 ක් වුවත්, 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමෙහි වෙනත් මූලාශ්‍ර ලැබීම් රු. 5,393,905 ක් දක්වා තිබීම නිසා මූල්‍ය ප්‍රකාශනයෙහි රු.416,836 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන පරිදි ගිණුම් සකස් කළ යුතු වීම. | මාසික පරිගණක මුද්‍රිත සටහන්වල දැක්වෙන වෙනත් මූලාශ්‍ර ලැබීම් වලට වඩා රු.416,836 ක්, සිදු වූ අත් වැරැද්දක් හේතුවෙනි. මෙය නිවැරදිව කර ඉදිරි ගිණුම්කරණ කටයුතු සැලකිලිමත්ව සිදුකරන ලෙසට උපදෙස් දෙන ලදී. |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම හා සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් වෙන වෙනම හෙළිදරව් කළ යුතුයි. එසේ වුවද එම වියදම් සියල්ල වෙනත් පුනරාවර්තන වියදම් රු.43,973,269 ක් වශයෙන් ඇතුළත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙන වෙනම ඒසීඒ - 06 යටතේ හෙළිදරව් කලයුතු සටහන් අංක 07 හා අංක 08 ට අදාල වටිනාකම් වෙන් වෙන්ව පෙන්වා ඇත. එහෙත් මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ එසේ පෙන්විය යුතු බව නොවැටහීම නිසා වෙන් වෙන්ව ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේ දී නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනවල අඩංගු ඒසීඒ - 2 ආකෘතියේ පුනරාවර්තන වියදම් සඳහා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් වටිනාකම රු. 700,000 ක් විය යුතු වුවත් අදාල ආකෘතියේ එම අගය රු. 70,000 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයන් හි වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනවල අඩංගු ඒසීඒ - 2 ආකෘතියේ පුනරාවර්තන වියදම් සඳහා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් වල නිවැරදි වටිනාකම රු. 700,000 කි. මෙය පරිගණකයට දත්ත ඇතුලත් කිරීමේ දෝෂයක් නිසා 70,000 ලෙසට ඇතුලත් වී ඇති අතර, එය නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේද ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම් වටිනාකම සමඟ කේවල වත්කම් වටිනාකම පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි තහවුරු කළයුතු වුවත්, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට රු.4,299,924 ක මූල්‍ය නොවන වත්කම් වටිනාකම භාණ්ඩාගාර ප්‍රධාන ලෙජර් ශේෂයන්හි ශූන්‍ය අගයක් ලෙස ප්‍රකාශ කිරීම නිසා චක්‍රලේඛ ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් සැසඳීමක් සිදු වී නොතිබුණි. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි වාර්තාවක් භාණ්ඩාගාර ශේෂයට එකඟ වන ලෙස ලේඛන පවත්වාගෙන යා යුතු වීම. | මූල්‍ය නොවන වත්කම් ලේඛනයට අනුව එහි වටිනාකම වූ රු.4,299,924 භාණ්ඩාගාර වත්කම් වාර්තා අනුව නොගැලපීම හේතුවෙන් එහි වටිනාකම ශූන්‍ය (0) බවට පත් කරන ලදී. එබැවින්, එහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් නොකරන ලදී. කෙසේ වුවද දැනට භාණ්ඩාගාර ලේඛන සමඟ එහි වටිනාකම යාවත්කාලීන කර ඇත. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒසීඒ - 01 සිට ඒසීඒ - 6 දක්වා ආකෘතිහි ඇතුලත් සංඛ්‍යා පදනම් කරගත යුතු වුවත් අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිළිවෙලින් රු.713,180 ක් හා රු.445,760 ක් ලෙසද ඒසීඒ ආකෘතියේ පිළිවෙලින් රු.846,406 ක් හා රු.581,986 ක් ලෙසද සටහන් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කල යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුලත් අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් තුළ මුදලින් ගෙවන ලද සහ මුදලින් ලබන ලද අත්තිකාරම් ඇතුළත් කර ඇත. නමුත් ඒසීඒ ආකෘතියේ ඇතුළත් අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් මුදලින් හා හරස් සටහන් වශයෙන් වෙන් වෙන්ව පෙන්නුම් කර ඇත. |

**1.6.4 අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි හා මූල්‍ය ප්‍රකාශ අතර අග්‍රිම පියවීම් හා අග්‍රිම ලැබීම් අතර රු.416,836 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනයන් හි වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | අග්‍රිම පියවීම හා අග්‍රිම ලැබීම් වල අත්වැරදීමක් හේතුවෙන් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයට වඩා රු.416,836 ක් වැඩියෙන් දක්වා ඇත. මේ තුළ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලැබුණු මුදලක් සහ හඳුනා නොගත් රු.28,924 ක මුදලක් ඇතුළත් වී ඇත. ඉදිරි ගිණුම්කරණ කටයුතුවලදී සැලකිලිමත්ව හා නිවැරදිව ගණනය කිරීම් සිදු කරන ලෙසට උපදෙස් දෙන ලදී. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබූ රු.මිලියන 1.21 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | දේශිය ගමන් වියදම් සඳහා ඉල්ලුම්පත් ගරු විනිසුරුතුමන්ලාගෙන් ඉදිරිපත් නොවීම හා ගරු විනිශ්වයකාරතුමන්ලා සඳහා වෙන් කර දී ඇති වාහනවල ප්‍රාග්ධන ස්වභාවයේ අළුත්වැඩියාවන් සිදු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සටහන් අංක **(iii)** යටතේ වන බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට, අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛහි | 2018 දෙසැම්බර් 31 දිනට පැවැති බැරකම් සඳහා අදාල බිල්පත් 2018 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබී ඇති බැවින් එම බැරකම් 2018 |

| | | |
|---|---|---|
| සමඟ එකඟ විය යුතුයි. එසේ වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් වටිනාකම ශුන්‍ය අගයක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් වටිනාකම රු.472,007 ක් විය. | 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ප්‍රකාශනවල ශුන්‍ය අගයක් පැවති අතර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අවස්ථාවේදී එම බැරකම් පිළිබඳ වාර්තාවක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන ලදී. |

## 3. යහපාලනය

------------

### 3.1 අභ්‍යන්තර විගණනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතුනි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (1) ඡේදය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වීම. | අභ්‍යන්තර විගණන ඒකකයක් නැත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මුළු පුරප්පාඩු 02 ක් වූ අතර එම පුරප්පාඩු දෙකම ප්‍රධාන කාර්යභාරයක් ඉටුවන ජ්‍යෙෂ්ඨමට්ටමේ තනතුරු 02 ක් විය. | කාර්යක්ෂම හා වඩා ඵලදායි සේවාවක් සැපයීම සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | ගරු විනිසුරුතුමන්ලාගේ පත්වීම් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය මත අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරනු ලබයි. |